ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
இலங்கையின் பிரதம அமைச்சர்
Prime Minister of Sri Lanka

### නබි නායකතුමාගේ දර්ශනය සමාජ සුබසිද්ධියට යොදා ගනිමු

මනුෂ්‍යත්වයෙන් පිරිපුන් ගෞරවණීය මානව ප්‍රේමයක් ගොඩනැගීමට කැපවූ නබි නායකතුමන්ගේ උපන්දිනය ලොව පුරා වෙසෙන ඉස්ලාම් බැතිමත්හු මහත් උත්සවාකාරයෙන් ආගමානුකූලව සමරද්දී, එකී දර්ශනය තුළින් සමාජයේ සහජීවනය ඇති කිරීම එතුමන්ට ගෞරව දැක්විය හැකි නිසි මාර්ගයයි.

මිනිස් වර්ගයාට අභිවෘද්ධිය, විමුක්තිය, සාමය, සතුට හා සැනසීම ගෙන දෙන අංග සම්පූර්ණ ජීවන ක්‍රමයක් දායාද කළ නබි නායකතුමාගේ මානුෂීය දර්ශනය අන් කවරදාටත් වඩා වත්මනේ සමාජ සුබසිද්ධියට යොදා ගැනීම කාලෝචිතය.

ලෝක ජනතා ගෞරවයට පාත්‍ර නබි නායකතුමාගේ ජීවිතාදර්ශයන්ට ගරු කරන ශ්‍රී ලාංකික ඉස්ලාමීය බැතිමතුන් ඇතුළු ලොව ඉස්ලාම් ජනතාවගේ ජීවිත සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම)
අග්‍රාමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

2023 සැප්තැම්බර් 27 දින